# නිර්මාණ Nirmana



## මගෙ මව්බිම ලංකා

මහ සමුදුරෙන් වට වී සොමි ගුණෙන් හෙබේ
මෝසම් සුළං වැසි ගෙන එයි කලට ඉබේ
වනපෙත් තැනිතලා දිය ඇලි එමට තිබේ
පෙරදිග මුතු ඇටය යයි ඉන් කියනු ලැබේ

අගනා මැණික් බිම් සිප සිප පිය නංගා
බටහිර දෙස බලයි කැළණිද කළු ගංගා
දකුණින් නිල්වලා වලවේ පිය හංගා
මහවැලි රජ රටට යයි මග ජය ගංගා

සුන්දර ළඳුන් සැරසෙන්නට හැම විටය
මන් නාරමෙන් හමුවන සුදු මුතු ඇටය
රන්මාලයට බැඳ පළඳී ගෙළ වටය
ඉන් පෙන්නුම් කරයි මේ දිවයින සෙටය

වළසුන් මී කඩන මස්කන කොටි සත්තූ
එලෙසින් වනේ රජ කරනා දළ ඇත්තූ
ගෝනුන් මුවන් කොවුලන් වෙන නද ගත්තූ
අබය බිම් හි ඇත යාලෙ ද විල් පත්තූ

ගමන දුර වුවත් මුහුදින් එතෙර යන
හමන සුළඟ අව් වැසි පිනි නොතක මීන
සවන පිනන ගී ගයනා මන නඳන
කුමන කුරුළු පුරයකි ලොව පතල වුණා

සර්කොන් ටූටයිල් පුලිමුඩෙ වැල්ලෙ හෙබේ
මිනිරන් බෝගල ද මීගහතැන්නෙ තිබේ
නිල්රතු ආරු මතුවෙයි මිනිපුරෙන් ඉබේ
රන්දිවයිනැයි අන්වත් නාමයද ලැබේ

රැරා දිය හැලෙන දුන් හිඳ දිය ඇල්ල
පේරාදෙනිය මල් උයනද හක් ගල්ල
හාරා මුහුදු කන දකුණේ සිඳු රැල්ල
පාරාදීසයක් කළෙළ පොල් තුරු නිල්ල

♦ **මිල්ලනියේ ඩී. ඇස්. වනිගසූරිය**
**මීගහතැන්න, කළුතර Sri Lanka**

## ඒ සඳ මමයි!

*ගියවර කලාපයෙහි පළවූ මේ ඒ සඳ ද නම් කවි පන්තියට පිළිතුරු වශයෙනි.*

වෙනසක් දැනුණි සිත යට ලෙන්ගතු ලෙසින
හඳුනා ගතිමි මිතු රටතොට සැරි සරන
තරුවක ලියා එවනෙමි පිළිතුරු හසුන
ඒ සඳ මමයි සා පැටවුන් නිති රකින

ආ බව අසා ඔබ ලන්ඩන් නුවර වෙත
තොරතුරු අසනු රිසියෙන් ඉවසුමක් නැත
කරුණක් ලියමි සෙනෙහසකින් අපරි මිත
දිවයින දකිමි ඔබ ඉන්නා සතර අත

ගුලිවී තිබේ නගරය හිම කැටිය මත
සුන්දර දසුන් අහනන් මුදු පවන නැත
එබිකම් කරන්නටවත් මට නොමැත සිත
නත්තල් සිරිය ඇත නොතබා මතට තිත

තේම්ස් නදිය තුළ දහවල සැඟවෙන් නම්
කිව් මහ උයන වෙත රෑ කල ගොඩවෙන් නම්
හිඳුවා බංකුවක ඔබ ඇකයට ගන් නම්
හිම කැටි වලින් බේරා උණුසුම දෙන් නම්

හිරු කිරණයක් දැකගන්නට නොමැත මෙහේ
සඳ කිරණයක් එවනෙමි ඉන් අඩුව වැහේ
දකිනා තුරා නැවතත් ඔබ නවම් මහේ
දෙපොලක තනිව අපි දෙදෙනා ඉඳිමු මහේ

♦ **මේජර් වී. බී. කරුණාරත්න**
**Oxford UK**

## සිංහ සිවලිගේ පසුතැවීම

මගෙ පියාණෙනි සමාවුව මැන
දළ සිතින් මා කෙරූ වරදට
රනින් බැබළී මිනෙන් දිලිසී
වැජඹුනත් මා නැසියන් මැද
හඬා වැළපෙයි මගේ හදවත
සැනින් ඔබ මා සිතට වන් කල

රුදුරු වනයේ සිරව සිටි මම
හැඟුම් වියැලී කෲර වූයෙමි
අගුළු ලා සෙනහසේ දොරගුළු
වසා සිරකොට තබා මුර ගල්
නික්ම ආයෙමි සොයුරු සමගින්
ඔබෙන් වෙන්වී නිවන සොයමින්

නැත පියාණෙනි! ලැබුණෙ සෙනෙහස
වැටහුණේ නැත සෙනෙහෙ මහිමය
ඔබෙන් ලද ඒ සොඳුරු සෙනෙහස
සිහිව මා ලය සැලේ නිබඳව

බැලූ බැලූ තැන ඔබේ රුව ඇත
ඇසූ ඇසූ තැන ඔබේ හඬ ඇත
අත ගැසූ තැන ඔබෙ පහස ඇත
පියාණෙනි! මා සිතින් ඔබ ළඟ

වෙන්න යළි මගෙ මුදු පියාණන්
පතමි හැමවිට වෙන් නොවෙන ලෙද
බැඳුණ සසරෙන් එතෙර යන තුරු
හිඳිමු අපි දූ පියා විලසින

♦ **මධුරි අබේවික්‍රම**
**Harrow UK**

## සැබෑව

හලා හල විස මතින්
වියැකුණු ආදරේ
පළාගිය පැල දොර
තවම විවරය අඩක්

කුස පොතු ගැටී
ඇස්ගෙඩි විවරවී
එනතුරා හාල් සේරුව
අකම්පිතය හදමඩල්

උහුලා සසර ගිනි පිණි
වගුරා සයුරු කඳුලිනී
වළපා හඬින් උලලේනී
ගලපා තබා දිවි ගමන්

♦ **සුධර්මා වීරක්කොඩි**
**Northern Ireland**

## මතකය

සුළඟ හමලා
පහන නිවලා
අඳුර ගලලා
මාව ගිලලා
එහෙත් නෑ කිසි
පාළුවක් මට
ඔබේ මතකය
තනි රකී නිති
නිසොල්මන් රෑ
ඇත අහසේ
පැයු තරුවක්
දිලෙන විලසේ
මගේ දිවියට
නො දී කළුවර

♦ **ප්‍රදීපා**
**London N11**

## සුනාමි විපත

දහයෙ විභාගය දිනුවා
කැවුම් උයා අත් තැව්වා
කිරිබත් පිස මට කැව්වා
මුළු ලොව දිනූ සේ සිතුවා

උසස් පෙළින් ජයගත්තා
සරසවි බිම පය තිබ්බා
උපාධියත් අරගත්තා
රජකු ලෙසට පිළිගත්තා

ලොව ඉහළින් වැජඹුනාට
පෝරුව මත අපි හිටියට
බිළිඳු සුවය ගෙය පිරුණට
ඔබ නෑ මට සුබ පතන්ට

මගෙ ආදර දෙමාපියන්
සුනාමියට බිලිවූයෙන්
ජීවිතයම නිරන්තරෙන්
හඬා වැටෙයි සෝ සුසුමෙන්

♦ **කුමාරි විජේරත්න**
**Hounslow Middx**



## අනේ ! මගේ නංගී

බොහෝ කලක් ගියත් නික්ම විපතට ආ අප කරා
ම හෝ ඝයකි හිතේ සෝක නැගෙන තවම බුර බුරා
ස හෝ දරිය බිලි ගති ඒ ජල කඳ මකරෙකු යුරා
අ හෝ ! එ දුක නිම නොවේය අපේ දිවිය ඇති තුරා

♦ **වික්ටර් විසුම්පෙරුම** **Rome, Italy**

## නව වසරේ නව සිතුවිලි

සිව්පා සතුන් රජයන වන්නියෙ බැද්දේ
ඉඳහිට ඇසෙයි බංකර පුපුරණ සද්දේ
ගෙවුනත් දොළොස් මහ ඒ කලබල මැද්දේ
නැත සැනසුමක් තව අහවර නැත යුද්දේ

අපකිර්තිමත් දස්කම් පෑ නොයෙක විරු
වසරේ හොඳම නළුවෝ මැති ඇමති වරු
වගකීමකින් රජයක් බර දරන තුරු
ලක්මව දියුණුවේ හිණිපෙත නගිනු බොරු

දිවැසින් මෙන් පෙනී සිදුවන දෙය රටට
නොසිතින් නමුත් මේ ලෙස සිත් දෙයි අපට
දක්කා සිටින ගව රැළ මස් කඩය කට
මැති සබයට ගෙනෙමු නායකයින් ලෙසට

නව වසරෙවත් නිසි මගකට යොමු වේවා
පාලකයින්ගෙ නෙත නුවණැස පෑදේවා
පෑගෙන පිරිස් දුක් මැසිවිලි නැසේවා
ජය කොඩි නගා සාමයෙ මල් පීදේවා!

ගුණවත් බවේ නව ඉල්ලම් මතු වේවා
එඩිතර පුතුන් යන මග මල් පීදේවා
ජන සිත් සතන් තුළ බිය සැක දුරුවේවා
සුබ සෙත සදා දෙන නවවසරක් වේවා!

අවුරුදු කුමරි නිල් ගුවනින් වැඩියා වේ
කලුවර වළා සඟවා ඉර දිලුනා වේ
යහපත් සමාජෙක බිජුවට ඉහුණා වේ
ආසිරි වැස්ස ලක් දෙරණට වැටුණා වේ!

♦ **ශ්‍රියා කුමාරසිංහ**
**New Zealand**

**ලංකාවිත්තියෙහි පළකිරීම සඳහා ඔබේ ලිපි හා කාව්‍ය රචනා එවන්න. ඒවා ඉඩ ඇති පරිදි ප්‍රමාද වී හෝ පළකරනවා ඇත.**

## කැප්පිටිපොළ විරුවාණෙනි !

අටසිය දහ අටේ උඩරට කැරැල් ලට
ඔබ පණ දුන්නු හැටි සිහිවෙයි අපෙ සිතට
පරගැති බවින් මව්බිම බේරා ගන්ට
පෙරමුණ රැගෙන ආවා ඔබ ඉදිරි යට

ඉංගිරිසින්ට එරෙහිව යුද කළෙ රුවට
එනමුත් නොහැකිවුණි රට බේරා ගන්ට
ඇහැලේපොළ ආදි ගැත්තන් නිසා වට
ඔබ අසුවුණා සතුරන්හට අපෙ පවට

කැප්පිටිපොලට එරෙහිව නඩුවක් තිබිණ
හෙළ හදවත් ගුවන හඬවමින් කියැ විණ
එනයින් ඔහුට අත්විය දඬුවම මරණ
තුන් සිංහලය ඉංගිරිසින්ට නතු වුණ

නොසිතා කිසිත් බිය හෝ චකිතයක් ගැන
මරණෙට මුහුණ දෙන්නට එඩිතර වෙමින
බුදුගුණ ගී ගයා හද සනසවා ගෙන
දම්පද පොතත් ඉන තිබුණා රුවා ගෙන

දාහට එකකි මේ වැනි විරුවන් ඇත්තේ
ඒ බව සුදු කටින් කියැවීලා ඇත්තේ
සකසා කොණ්ඩෙ මුදුනට කර බැඳ ගත්තේ
ගහලය එක සැරින් මා ගෙල සිඳ යුත්තේ

රට බේරාගන්න ගොස් දිවි නොතකාම
කඩුවට බෙල්ල පෑවේ ඔබ නොලසාම
අල්ලස් වලට මව්බිම පාවා දීම
නොපතා ඔබ සිතුවෙ මරණය වෙත යෑම

මේ වැනි පවිටු දන අතරේ ඉපදෙන් න
හෙළ වීරයාණෙනි ඔබ නම් නොපතන් න
ඉරණම විලස මරණෙන් බැහැ වලකින් න
කෙළවර සසර නිවනේ ඔබ සැනසෙන් න

♦ **එස් කංකානම්ගේ**
**London SW 2**

## අපේ අභිමානය

වෙල් යායවල් ඇත කරලින් බර වීලා
වී බිහි උතුරාවි ගොවිනගෙ හිත පිරිලා
ගමේ සැම දෙන ගම් මඩුවක් නටලා
සැනසෙයි බෝ රදුට පුද පූජා තබලා

සන්සුන් සිතින් සිල්ගෙන සිට බෝ මළුවේ
වඩමින් භාවනා හිඳගෙන වැලි මළුවේ
රන්මැලි සැය නිති මෙත් සිහිලෙන් නැහැවේ
සිරිමා බෝ රදුන් ළඟ දැහැනට සමවේ

උවසුන් ගයන ගාථා රැව් දේ දසත
ලොව්තුරු සතුට දනවයි ඒ අසන සිත
හෙළ විරුවනගෙ දස්කම් ඇත සියළු අත
දළදා පෙරහරින් ගෙන දෙයි රටට සෙත

මහියංගනය කැළණිය නාගදී පෙද
මුතියංගනය සමනල රැඳුණ සිරි පද
රජ රට පුරා අභිමානය රැඳුණි තෙද
හමුදා පුතුන්ගේ පිහිටයි රටට අද

♦ **රත්නාවලි කුමාරි දිසානායක**
Hounslow Middx **UK**



**අපවත්වී වදාළ පූජ්‍ය ගංගොඩවිල සෝම ස්වාමීන් වහන්සේගේ හතර වෙනි අනුස්මරණ දිනයේ බර්ලින් විහාරයේ පැවති පිංකමේ දී ගායනා කළ කවි පන්තියයි මේ.**

## බර්ලින වෙහෙරේ සෝම හිමි ගුණ සැමරේ

ගුණ නැණ බෙලෙන් වැඩ කළ හැටි හැම දාම
සිහියට නැගේ හිමියනි ඔබෙ නම තාම
ජාතියෙ පිනට ලැබුණේ සඟ රජු පේම
සමරමු බැතින් ගංගොඩවිල හිමි සෝම

යා ම නිසා අපවත්වී කල් ගෙවුණේ
තා ම අපට සිහිවෙනවා පෙර ලෙසිනේ
කෝම අනේ වාවන්නද නොදැන බණේ
සෝම සමිඳු යළි ඇවිදින් දෙසනු මැනේ

සු රා සුදු මත් වතුරෙන් නොනැ සෙන්න
පෙරා දහම් මිහිරෙන් හිමි දෙස මින්න
කි රා බලනු බැහැ ගුණ නැණ පිරි පුන්න
ද රා ගන්නෙ කොහොමද හිමි නොද කින්න

දැනගත් නමුදු බුදු බණ හිත දරා ගෙන
අ ප වත් වුණා මරු රහසෙම පැමිණි දින
කර ගත් අප විසින් මේ පින ලබා ගෙන
සැපවත් වන්න නිවනයි සැනසීම දෙන

මු දා ගන්න පාපෙන් හැම දෙනම කරා
බෙදා අරුත් දහමෙහි රස මිහිර පෙරා
නි දා සිටිය හෙළයන් නිති අවදි කරා
ස දා අපිත් පිං දෙමු හිමි ගුණ සමරා

අ වු රුදු ගෙවී තව අවුරුදු ළං වෙනවා
කවුරුත් ලොවේ ලද දිවි හැර වෙන් වෙනවා
මව් තුරුළේද සිටියත් එය සිදු වෙනවා
සිව් වසරටද හිමි සමරා පිං දෙනවා

සක් වල පවා විහිදුණ ඒ ගුණ කඳට
ලක් මව තාම අඬනව පුතු නැති කමට
රැක් මෙන් උතු දහමක් කළ යහ පතට
දු ක් නොම වන්න හිමි ගියෙ සැපවත් තැනට

♦ **පූජ්‍ය විලච්චියේ ධම්මවිජය හිමි**
**බර්ලින් බෞද්ධ විහාරය - ජර්මනිය**

## අරුමයක අසිරිය

පුංචි සුසුමක නුඹ සලාගිය හදවතේ
මහා මෙරකට වඩා බර ඉදිවී ඇතේ
එයින් මතුවිය රහස අරුමැති ජීවිතේ

සිනා අබැටක් මුවින් විසිවුණු දා නුඹේ
විසල් අහසක් තරම් හැඟුමක් විය සිතේ
තුසර බිඳුවක උපන් සයුරකි ආදරේ

කූඹි ඉහියක් හොරෙන් මතු වූ දා නෙතේ
යදම් පවුරක් කැඩී බිඳිලා ගොස් ඇතේ
එක් ඇසිල්ලක ගෙවුණු කල්පෙකි ආදරේ

♦ **මහින්ද ප්‍රසාද් මස්ඉඹුල**
**ගොඩකවෙළ Sri Lanka**

## සමාවෙන් ! මගේ හොඳ අප්පච්චි

අම්ම නැතිදා පටන් බලාගත්තා මාව
ඔබේ ඇහැ ලෙසින් රැක හදාගත්තා මාව
දොඩන්නේ කෙලෙස අද අකීකරු වී ඔබට
ඔබෙන් සමුගැන්ම දුක නිසයි කඳුලැලි නෙතග

හෙට දිනක ඔබෙ සෙවන අතැර නව මං සොයා
පිය නගනු කෙලෙසක ද සතුට සෙනෙහස මවා
හැර නොයමි රැඳෙමි ඔබෙ දෙපා මුල සෝ නිවා
මා රකින දෙව් ඔබය වදිමි උදයේ හවා

තුරුණු විය තිළින කොට ආදරේ කඳුළකට
ඔබෙ සතුට දැක බිඳක් හිනැහෙන්න ඇහැකි මට
තනි රකිමි දිවිය ඇති තුරා මම කුල ගෙයට
සමාවෙන් ! අප්පච්චි තවත් දඬුවම් නොකොට

♦ **සන්ධ්‍යානි සේනාරත්න**
**London SW15**